# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1818/30 - 2013 ජූලි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2013.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2012 අංක 12 දරන මුදල් පනත**

2013 අංක 12 දරන මුදල් පනත මඟින් සංශෝධිත, 2012 අංක 12 දරන මුදල් පනතේ IV වැනි කොටස යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් සිදු කරනු ලබන නියෝගය.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2013 ජූලි මස 10 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

නියෝගය

1. මෙම නියෝගය, මුදල් පනතේ - 2013 වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග අංක 1 ලෙස හඳුන්වනු ලැබේ.

2. සංශෝධිත පරිදි 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය මඟින් ස්ථාපිත, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉහත කී නීතියේ 17 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය සහ යම් ව්‍යවසායක් අතර එළඹ ඇති ඕනෑම ගිවිසුමක් අන්තර්ගත කර ඇති හෝ නීති ගත කර ඇති 1978 ඔක්තෝබර් මස 31 දිනැති අංක 8/2 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මඟින් ප්‍රකාශයට පත්කළ 1978 අංක 01 දරන රෙගුලාසිවල අන්තර්ගතයට අමතරව, 2013 අංක 12 දරන මුදල් පනත මඟින් සංශෝධිත පරිදි 2012 අංක 12 දරන මුදල් පනතේ (ප්‍රධාන පනත) IV වැනි කොටසේ දක්වා ඇති විධි විධාන සම්බන්ධයෙන් බලපැවැත්වෙනු ඇත.

   (1) එම නව ව්‍යවසාය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින බලපත්‍රලාභී වාණිජ බැංකුවක විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් හරහා මෙරටට ප්‍රේෂණය කරනු ලැබූ විදේශ මුදල් ද ඇතුළත්ව මුළු ආයෝජනයෙන් අවම වශයෙන් සියයට හැට පහක් (65%) විදේශීය මූලාශ්‍ර මඟින් ආයෝජනය කරනු ලැබ, ශ්‍රී ලංකාව තුළ අලුතින් පිහිටුවනු ලැබූ හෝ සංස්ථාගත කරනු ලැබූ නව ව්‍යවසායක් විය යුතු අතර පහත සඳහන් ව්‍යාපාරික කටයුතු වලින් එකක් හෝ කිහිපයක් මත වූ භාණ්ඩ සහ/හෝ සේවා අපනයනය මත වූ පිරිවැටුම මත රේගු ආඥා පනත (235 පරිච්ඡේදය), විනිමය පාලන පනත (423 පරිච්ඡේදය), 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත සහ 2013 අංක 12 දරන මුදල් පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි උපලේඛනයෙහි දක්වා ඇති පනත් හි විධිවිධානයන් අදාළ කිරීමෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

(අ) ආනයනයන්, සුළු පිරිසැකසුම් කර නැවත අපනයනය කිරීම සම්බන්ධ අන්තරාල වෙළඳාම,

(ආ) එක් රටකින් සපයා ගනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද භාණ්ඩ, ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක් වෙරළ ව්‍යාපාර,

(ඇ) විදේශීය සේවාදායකයින් හට පෙර නිමි සේවාවන් සැපයීම,

(ඈ) මූල්‍ය සැපයුම්දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මඟින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදුකිරීම,

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රටවල් සංගෘහිත කිරීම් වැනි සැපයුම් සේවා සිදුකිරීම.

තවද ප්‍රධාන පනතෙහි අර්ථකථනය කර ඇති පරිදි, යම් ව්‍යාපාරයක් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ අන්තරාල වෙළෙඳාමෙහි නියුක්ත නම්, එබඳු භාණ්ඩයක් දේශීය වෙළෙඳපොලෙහි පැවතීම ජාතික ආර්ථිකයට අවශ්‍ය වන විටෙක, මුදල් අමාත්‍යවරයාගේ පූර්ව එකඟතාවය සහිතව මණ්ඩලය සහ එබඳු යම් ප්‍රතිශතයක් දක්වා දේශීය වෙළෙඳාම සිදුකිරීමට සහ ශ්‍රී ලංකා රුපියල් මගින් ගෙවීමට අවසර දී ඇති විටෙක, එකී දේශීය වෙළෙඳාමෙහි පිරිවැටුම සැලකිය හැකි අපනයන පිරිවැටුමක් ලෙස සැලකිය යුතුය.

කෙසේ වුවද :-

(i) ඉහත (අ) සහ (ඉ) යටතේ දක්වා ඇති ව්‍යාපාරවල නියුතු සහ ද්‍රව්‍යමය වශයෙන් භාණ්ඩ ආනයනයෙහි නියුතුවීම, වෙළෙඳ භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ප්‍රතිඅපනයනය කිරීම වැනි ව්‍යාපාර කටයුතුවල නියුතු නව ව්‍යවසායන් එම කටයුතු නිදහස් වරායක් තුළ හෝ ප්‍රකාශිත බන්ධිත ප්‍රදේශයක මෙහෙයවිය යුතුය. එසේ වුවත්, ප්‍රධාන පනතෙහි අර්ථකථනය කර ඇති පරිදි අන්තරාල වෙළෙඳාමෙහි නියුක්ත වන්නේ නම්, මෙම විධිවිධාන යටතේ භාණ්ඩයක් නිෂ්පාදනය හෝ එකලස් කිරීමට අනුමැතිය ලබා ඇත්නම්, එබඳු ව්‍යාපාරයක් විශේෂයෙන් සඳහන් කල බන්ධිත ප්‍රදේශයක හෝ නිදහස් වරායක පමණක් මෙහෙයුම් කටයුතු කළ යුතුය.

(ii) ඉහත (ආ), (ඇ) සහ (ඈ) යටතේ දක්වා ඇති ව්‍යාපාර කටයුතුවල නියැලි නව ව්‍යාපාරයක් නිදහස් වරායෙන් පිටත හෝ බන්ධිත ප්‍රදේශයක ස්ථාපිත කළ හැකිය.

(iii) ඉහත (අ) යටතේ දක්වා ඇති ව්‍යාපාර කටයුතුවල නියුතු නව ව්‍යාපාරයක් විසින් ඇ.ඩො. මිලියන පහක් (ඇ.ඩො. මිලියන 05) වන අවම ආයෝජනයක් සහිතව අදාළ ගිවිසුම් එම ව්‍යාපාරය හා මණ්ඩලය අතර අත්සන් කිරීමෙන් මාස හයක් (06) ක් ඇතුළත ස්ථාවර වත්කම්වල ආයෝජනයක් කළ යුතුය. එසේම, එබඳු ව්‍යාපාරයක් ව්‍යාපාර මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර පහක් පුරා වාර්ෂික ප්‍රතිඅපනයන පිරිවැටුම ඇ.ඩො. මිලියන 20 ට නොඅඩුව පවත්වා ගත යුතුය.

(iv) ඉහත (ඉ) යටතේ දක්වන ලද ව්‍යාපාර කටයුතුවල නියුතු නව ව්‍යාපාරයන්හි අවම ආයෝජනය ඇ.ඩො. මිලියන තුනක් වන අතර, අදාළ ගිවිසුම අත්සන් කිරීමෙන් මාස හයක් (06) ක් ඇතුළත ස්ථාවර වත්කම්වල ආයෝජනය සිදු කළ යුතුය. එසේම, එබඳු ව්‍යාපාරයක් ව්‍යාපාර මෙහෙයුම් ආරම්භකළ දින සිට වසර පහක් පුරා වාර්ෂික ප්‍රතිඅපනයන පිරිවැටුම ඇ.ඩො. මිලියන 15 ට නොඅඩුව පවත්වා ගත යුතුය.

(v) (ආ), (ඇ) සහ/හෝ (ඈ) යටතට අයත් ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල නියුතු වන නව ව්‍යාපාරයක් ආයෝජනය කළ යුතු අවම මුදල ඇ.ඩො. මිලියන එකක් (ඇ.ඩො. මිලියන 1) වන අතර එය ස්ථාවර වත්කම් සඳහා ආයෝජනය කළ යුතු සේම එම ආයෝජනය, ව්‍යාපාර ආයතනය සහ මණ්ඩලය අතර අදාළ ගිවිසුම අත්සන් කළ දින සිට මාස (6) ඇතුළත ප්‍රේෂණය කළ යුතුය. එසේම, මෙවැනි ව්‍යාපාරයක් තම ව්‍යාපාරික කටයුතු ආරම්භ කළ දින සිට වසර පහක කාලයක් දක්වා වාර්ෂිකව ඇ. ඩො. මිලියන 10 ට නොඅඩු ප්‍රතිඅපනයන පිරිවැටුමක් පවත්වා ගත යුතුය.

3. 2 (1) (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යටතේ සඳහන් ව්‍යාපාරික කටයුතුවල නිරත වන ව්‍යාපාරයක් මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද ආකෘති පත්‍ර මගින් සිය සියලු ගනුදෙනු පිළිබඳ සවිස්තරාත්මක පැහැදිළි වාර්තා පවත්වා ගත යුතු අතර, ඊට සියලු අභ්‍යන්තර හා බාහිර විදේශ විනිමය ප්‍රේෂණය කිරීම් පිළිබඳ තොරතුරු අන්තර් ගත විය යුතු සේම එම වාර්තා වාර්ෂිකව මණ්ඩලය සහ විනිමය පාලක වෙත ඉදිරිපත් කළ යුතුය. එසේම, මණ්ඩලය හෝ විනිමය පාලක විසින් ඉල්ලා සිටින අවස්ථාවක ඉදිරිපත් කිරීම පහසු වීම පිණිස ඕනෑම අවස්ථාවක සිට පසුපසට වසර තුනක කාලයක් දක්වා මෙම වාර්තා අදාළ ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සිදු කරන ස්ථානයේ පවත්වාගෙන යා යුතුය.

4. 2 (1) (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යටතේ සඳහන් ව්‍යාපාරික කටයුතුවල නිරත වන නව ව්‍යාපාරයක්, අවශ්‍ය වන පරිදි රේගු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නිදහස් වරාය හෝ බන්ධිත ප්‍රදේශ සම්බන්ධයෙන් එක්ව සිදු කළ හැකි මෙහෙයුම් ක්‍රියාමාර්ගයන්ට යටත් විය යුතුය.

5. යම් භාණ්ඩයක් ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති විට හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කර ඇති විට, එම භාණ්ඩය ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය වෙත හෝ ඉන් පිටතට ගෙනයන අවස්ථාවක දී අදාළ පරිදි රේගු ආඥා පනතේ සහ ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන අදාළ විය යුතුය.

6. මෙහි සඳහන් කුමන ආකාරයකින් නිදහස් කිරීම් ලබා දී තිබුණ ද, මෙම නීති මාලාව අදාළ වන සියලුම ව්‍යාපාරයන් රේගු ආඥා පනතේ උපලේඛනය (ආ) යටතේ පනවා ඇති සීමා කිරීම් සහ තහනම් කිරීම් සඳහා යටතේ වේ. රේගු ආඥා පනතේ උපලේඛනය (ආ) යටතේ පනවා ඇති සීමා කිරීම් සහ තහනම් කිරීම්වලට එරෙහිව යමින් යම් ව්‍යාපාරයක් කටයුතු කරන්නේ නම්, මෙම නීති මාලාවට අදාළ වන ඕනෑම ව්‍යාපාරික ස්ථානයක් වෙත ඇතුළු වීමට සහ අවශ්‍ය පියවර ගැනීමට රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ ඕනෑම නිලධාරියෙකු වෙත බලය ඇත.

7. කෙසේ වුවද, ඉදිරියට ද සංශෝධනය විය හැකි, විනිමය පාලන පනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහය 432 ඡේදය) 7, 10, 11, 15 සහ 30 (5) යන පරිච්ඡේද අනුව විනිමය පාලකවරයා විසින් අංක 1232/14 2002 හා 2002.04.19 දිනැති *ගැසට් නිවේදනයේ* 3(අ) පරිච්ඡේදය මගින් පනවා ඇති "සීමාවන්" මෙම ව්‍යාපාර සඳහා අදාළ නොවන අතර එබැවින් මෙම ව්‍යාපාරයන්හි විදේශීය අයිතිවාසිකම් සඳහා අවසර දිය හැකිය.

8. ඉහත 2 (1) (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යටතේ සඳහන් ව්‍යාපාරික ක්‍රියාකාරකම්හි නිරත වන නව ව්‍යාපාරයක්, අදාළ පරිච්ඡේදයන්හි සඳහන් කර ඇති අවශ්‍යතා සම්පූර්ණ කිරීමට යටත්ව සංශෝධිත පනත් වලින් සංශෝධනය කරන ලද 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 13 (ආ) (i), 13 (ආ) (ii), 13 (ආ) (iii) සහ 13 (ඈ ඈ ඈ), 16 (ඇ) පරිච්ඡේදය, 16 (ඈ) පරිච්ඡේදය සහ 17 (අ) පරිච්ඡේදය යටතේ දැක්වෙන බදු සහන සඳහා සුදුසුකම් ලබයි.

9. 2 (1) (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යටතේ සඳහන් ව්‍යාපාරික ක්‍රියාකාරකම්හි නිරත වන නව ව්‍යාපාරයක්, ඇ.ඩො. මිලියන 10 ට නොඅඩු ආයෝජනයක් සිදුකර ඇති විට සහ පනතේ සඳහන් සුදුසු ක්‍රියාවලීන් අනුගමනය කර ඇති විට, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ද සලකා බැලිය හැකිය.

10. මෙම නියෝගය යටතේ දක්වා ඇති ඕනෑම ව්‍යවසායක් සඳහා බන්ධිත ගුදම්වලට සහ නිදහස් වරායට ඇතුළු වන දේශීය අපනයනවලට පමණක් වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ප්‍රභවස්ථාන සහතිකය (Country of Origin Certificate) නිකුත් කරනු ලැබේ.

11. 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 2 (iii) වගන්තියේ විධිවිධාන යටතේ කොළඹ සහ හම්බන්තොට වරායන්, මෙම නියෝගයෙහි අවශ්‍යතාවයන් සඳහා නිදහස් වරායන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

12. 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනත මගින් ප්‍රකාශිත කටුනායක අපනයන සැකසුම් කලාපය සහ කොග්ගල අපනයන සැකසුම් කලාපය, මෙම නියෝගයෙහි අවශ්‍යතාවයන් සඳහා බන්ධිත ගුදම් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

13. 1955 ගුවන් සන්තරණ රෙගුලාසි යටතේ 2013 පෙබරවාරි මස පළමුවැනි දින අංක 1795/52 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 126 වැනි නියමය යටතේ ප්‍රකාශිත සහ රේගු ආඥා පනතේ (235 පරිච්ඡේදය) (iii) වගන්තිය යටතේ නිකුත් කල අංක 2013 මාර්තු 07 දින අංක 1800/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 'අ' උපලේඛනයේ සඳහන් සීමාවන්ට යටත්ව මත්තල පිහිටි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මගින් ප්‍රකාශිත මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය මෙම පනතේ අවශ්‍යතාවයන් සඳහා විශේෂිත බන්ධිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

08-301

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.